# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1943/5 - 2015 නොවැම්බර් මස 30 වැනි සඳුදා - 2015.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: MTR/LND/ACQUI/L2/3958.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය.*: 03/ජේ/68/69/එල්/81/වීරි.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර*:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැකණඳුර නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ මු.පි.මාර 729 පිඹුරේ කැබලි අංක 02 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර කිරල කැලේ ව්‍යාපාරය සඳහා අත්කර ගෙන තිබේ.

උපලේඛනය

01. **කැබලි අංක 02**

ඉඩමේ නම: මෝදර කැලේ; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: ගුණදාස කුල සමනායක, අංක 89, ප්‍රදීපාගාර පාර, දෙවිනුවර; ප්‍රමාණය: අ. 7, ප. 17, රූ. 13.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 දෙසැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 දෙසැම්බර් මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 482

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: KDS/PJP/4/4/2/තැ/59.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය.*: 03J/94/PT/171.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර*:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම් පහකෝරළේ සුළු කොට්ඨාසයේ, පලීපාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2006.04.24 දිනැතිව, මැන සකස් කරන ලද අංක මහ 5802 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන අඹකොටෛගෙදරවත්ත නැමති ඉඩමෙන් මුළු

ප්‍රමාණයෙන් හෙක්. 0.0535ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

*උතුරට* : මාර්ගය සහ ශ්‍යාමලී රුද්‍රිගෝ හිමිකම් කියන අඹකොටේගෙදරවත්ත; *නැගෙනහිරට*: ශ්‍යාමලී රුද්‍රිගෝ හිමිකම් කියන අඹකොටේගෙදරවත්ත; *දකුණට* : ශ්‍යාමලී රුද්‍රිගෝ හිමිකම් කියන අඹකොටේගෙදරවත්ත සහ මු.පි. මහ 5667 හි කැබලි අංක 1; *බටහිරට*: මු.පි. මහ 5667 හි කැබලි අංක 1 සහ මාර්ගය.

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්:

1. ඩී. ආර්. විජිත මයා, අංක 23ඒ, බොක්කාවල.
2. යූ. ජී. උපනන්ද මයා, අංක 57/1, දිද්දෙණිය

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 පෙබරවාරි මස 24 වැනි දින ප. ව. 1.30ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

එම්. ඩබ්. එම්. එම්. මඩහපොල,
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

2015 නොවැම්බර් මස 24 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 483

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.